අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය
அத்தியாவசிய சேவைகள் ஆணையாளர் நாயகம் அலுவலகம்
OFFICE OF THE COMMISSIONER GENERAL OF ESSENTIAL SERVICES

**2025-දෙසැම්බර්-03 ප.ව.9.15**
**ගොනු අංකය : 2025/06**

# මාධ්‍ය නිවේදනය

දිවයිනට බලපා ඇති සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් අපදාවට පත් වී ඇති ප්‍රදේශවල ජනතාව අතුරින්, සායන, චිකිත්සා හා වෛද්‍ය පරීක්ෂණ සඳහා රෝහල්වල දින ලබා දී ඇති රෝගීන්ට මෙම කාලය තුල නියමිත පරිදි රෝහල්වලට පැමිණීමට නොහැකි බැවින්, එවැනි රෝගීන් හට මෙකී ආපදා තත්වය පහව ගිය පසු නව දින ලබාදීමටත් එහිදී ම එම අයවලුන්ට ප්‍රමුඛතාව ලබාදීමටත් කටයුතු කරන ලෙසත් සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම් වරයා දැනුවත් කර ඇත.

විවිධ අංශයන්ට සිදුවූ හානි පිළිබඳව ලැබුනු වාර්තා වලට අනුව ගොවිජන සේවා දෙපාර්තමේනතුවට අයත් වැව් 1777ක්, අමුණු 483ක් , ඇල මාර්ග 1936ක් සහ කෘෂි මාර්ග 328ක් හානියට පත්වී ඇති බව මේ දක්වා හඳුනාගෙන ඇති අතර , කුඹුරු අක්කර 137265ක් විනාශයට පත්වී ඇති බවත් වාර්තා වී ඇති අතර, මේ දක්වා හඳුනා ගෙන ඇති පරිදි සුළු වාරි මාර්ග 305ක්ද හානි වී ඇත.

මීට අමතරව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් , ප්‍රවාහනයට බාධා පැවති මාර්ග 246ක ප්‍රමාණයක් මේ වන විට වාහන ධාවනයට හැකි වන පරිදි යථාවත් කොට ඇත. කෙසේ වෙතත් දිවයිනේ මාර්ග පද්ධතියේ පාලම් 22ක් විනාශ වී ඇති අතර , ඉන් 6ක් ඌව පළාතටත්, 4ක් උතුරු පළාතටත්, 4ක් වයඹ පළාතටත්, 3ක් බස්නාහිර පළාතටත්, 2ක් මධ්‍යම පළාතටත්, 2ක් නැගෙනහිර පළාතටත් ,1ක් උතුරුමැද පළාතටත් අයත් වේ. එමෙන්ම මෙරට දුම්රිය මාර්ග පද්ධතියට සුවිශාල හානියක් වී ඇති බව හඳුනා ගෙන ඇති අතර, දිගින් කිලෝමීටර 1,593ක් වන සමස්ථ දුම්රිය මාර්ග පද්ධතියෙන් මේ අවස්ථාවේදී දුම්රිය ධාවනය සඳහා යොදා ගත හැකිව ඇත්තේ කිලෝ මීටර් 478ක දුර ප්‍රමාණයක් පමණි.

බිඳ වැටුනු දුරකථන සම්බන්ධතා වලින් 91%ක් මේ වන විට යථා තත්වයට පත් කර ඇත.කෙසේ වෙතත් නුවර එළිය දිස්ත්‍රික්කයේ විදුලි සංදේශණ පහසුකම් යථාවත් කිරීම් තව දුරටත් සිදු කල යුතුව ඇත.

එමෙන්ම ආපදාවත් සමඟම ක්‍රියාකාරීත්වය බිඳ වැටුනු විදුලි උප පොලවල් 16178 කින් 11315ක් නැවත සක්‍රීය කොට ඇති අතර ඒ අනුව බිඳවැටුනු පාරිභෝගික විදුලි සම්බන්ධතා 3,531,841 කින් 2526264 , එනම් 72%ක් නැවත යථා තත්වයට පත් කර ඇත.

Email Address: cg@esgovsl.com ; cg@ocges.gov.lk
අංක 150, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
எண். 150, ஆர்.ஏ. டி மல் மாவத்தை, கொழும்பு 03, இலங்கை
No. 150, R.A. De Mal Mawatha, Colombo 03, Sri Lanka

අද දිනය තුල, ගොඩබිම් මාර්ග වලින් ලඟා වීමට නොහැකිව තිබූ අරනායක ප්‍රදේශයේ ආපදාවට පත් පිරිසට ගුවනින් වියළි ආහාර සැපයීමත්, වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සහය ලබා දීමත් සිදු විය.

තවද , නිවාස සහ ගොඩනැගිලි අවධානම් තත්ව පරීක්ෂා කිරීම සඳහා, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට සහය වීමට, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, ජල සම්පත් මණ්ඩලයේ, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශයේ , වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යංශයේ සහ පේරාදෙණි විශ්ව විද්‍යාලයේ භූ විද්‍යාඥයින් සම්බන්ධ කිරීම සිදුවිය.

විශේෂයෙන්ම සංවර්ධන පාර්ශව කරුවන්ගේ සහයෝගය ලබා ගැනීම සඳහා, දේශගුණ විපර්යාස ප්‍රතිචාරාත්මක , ප්‍රතිස්ථාපන සහ ප්‍රතිසංස්කරණ ආයෝජන සැලැස්ම (Climate Responsive Recovery And Reconstruction Investment Plan - CRRRIP) කඩිනමින් සකස් කරන ලෙස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් වරයාට දැනුම් දී ඇත.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති

අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්